# අයදුම්පත් කැඳවීම

**සී/ස ගාල්ල දිස්ත්‍රික් ස.ණස. සමිති සංගමයේ පුරප්පාඩුව පවතින පහත තනතුර සඳහා 02/2022 දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ චක්‍රලේඛනය අනුව අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සාමාන්‍යාධිකාරී තනතුර

**කේත අංකය : EL 01 (III ශ්‍රේණිය)**

**වැටුප් පරිමාණය : 29,500 - 900 x 5 - 1,000 x 5 - 1,100 x 10 - 1,200 x 10 – 1,300 x 12 -77,600**

සමුපකාර සේවක කොමිෂන් සභාව ( දකුණු පළාත ) 06 / 2024 (1) චක්‍රලේඛනය අනුව අනුමත අතිරේක දීමනාව රු.7,500.00 හා ජීවන වියදම් දීමනාව රු. 9,500.00 ද ගෙවනු ලැබේ.

තවද සේවක අර්ථසාධක අරමුදලට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සහ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කරනු ලබන අතර, හදිසි අනතුරු රක්ෂණාවරණයක්, නිල ඇඳුම්, කාර්යාල කටයුතු සඳහා දුරකථන පහසුකම් ද හිමිය.

**වයස් සීමාව :** අවු. 18 ත් 45 ත් අතර විය යුතුය. (සමුපකාර සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ)

**සුදුසුකම් :**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ්‍ය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම හෝ
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක විධායක තනතුරක වසර 05 කට නොඅඩු පළපුරුද්ද / පුහුණුව ලබා තිබීම හෝ
- සමුපකාර සේවයේ EL 02 මට්ටමේ I ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL 02 මට්ටමේ II ශ්‍රේණියේ තනතුරක වසර 04 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**සැලකිය යුතුයි :**

දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 01 – 2026 සුදුසුකම් සංශෝධන හා වැටුප් සංශෝධන චක්‍ර ලේඛය සම්මුඛ පරීක්ෂණ දිනට පෙර නිකුත් වුවහොත් ඒ අනුව සංශෝධිත වැටුප් වැඩිවීම් හා සුදුසුකම් අනුව බඳවා ගැනීම සිදු වේ.

සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අදාළ සමිතිය මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. වෙනත් සමිතියක සේවය කරන අතරතුර ඍජුව අයදුම්පත් එවා ඇති බව ඔහු / ඇය තෝරාගත් පසුව වුවද අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් සහාථ කිරීමේ අධ්‍යාපන, වෘත්තීය සහතිකවල පිටපත් උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතත් ද සමග පහත සඳහන් දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය – 2026.02.20

ලිපි කවරයේ වම්පස ඉහළ **"සාමාන්‍යාධිකාරී තනතුර"** යන්න සඳහන් කළ යුතුය. අයදුම්පත් එවිය යුතු ලිපිනය –

**ගරු සභාපති,**
**සී/ස ගාල්ල දිස්ත්‍රික් සණස. සමිති සංගමය,**
**"තක්සලා" , 153, අබ්දුල් වහබ් මාවත, ගාල්ල.**
**දුරකථන අංකය : 0912222745**